# 14 කල්වාරි යාගය

## පුරාණ ගිවිසුමේ යාග

පුරාණ ගිවිසුමේ වන්දනාවේ කේන්ද්‍රීය ක්‍රියාව, යාග පූජා පුද කිරීම ය. මෙම යාග පූජා සඳහා ආහාරපාන හා සතුන් යොදා ගැනුන ද එයින් වඩාත් ම වැදගත් වූයේ, සත්ත්ව පූජා ය. මන්ද සත්ත්වයාගේ රුධිරය තුළ ජීවිතය අන්තර්ගත වූ බැවින් හා ජීවිතය දෙවියන් වහන්සේට අයිති වූ බැවින් ය (ලෙවී 3:17, 7:26, 17:10, 17:11).



14.1 රූපය - පුරාණ ගිවිසුමේ දුම් පූජාවක් සිදු කිරීම

**යාග පැවැත්වීමේ පරමාර්ථ**

- පව්වලට වන්දි ගෙවීම සඳහා
- දෙවියන් වහන්සේ සමග යහපත් හා අඛණ්ඩ සම්බන්ධතාවක් පවත්වා ගැනීම සඳහා

ඉශ්‍රායෙලයේ පූජා ප්‍රධාන කොටස් දෙකකට බෙදිය හැකි ය.

1. දවන පූජා - මේ සඳහා ගවයන් (ලෙවි 1:3-9) බැටළුවන්, එළුවන් (ලෙවි1:10-13) හා කුරුල්ලන් (කොබෙයියන් හා පරවියන්) (ලෙවි 1:14-17) භාවිත විය.

2. නොදවන පූජා - ආහාර පාන (පිටි, ධාන්‍ය, තෙල්, මිදියුස, පූප)

දවන පූජා ප්‍රධාන වශයෙන් වර්ග සතරකි:

1. සම්පූර්ණයෙන් දවන පූජා
2. සහභාගිකමේ පූජා (සාම පූජා)
3. පාප පූජා
4. වන්දි ගෙවීමේ පූජා



නොමිලේ බෙදහැරීම සඳහා ය.

# කල්වාරි යාගය

ඒ සියලු යාග ක්‍රිස්තුන් වහන්සේ කල්වාරි යාගය මගින් සම්පූර්ණත්වයට පත් කළ සේක. එම නිසා පැරණි ගිවිසුමේ විවිධ පූජා පැවතිය ද නව ගිවිසුමේ පවතින්නේ එක ම එක යාගයකි. එනම් කල්වාරි යාගය යි. කල්වාරි යාගය අත්‍යන්ත වූ ද අපරිමිත වූ ද සදතනික වූ ද අමිල යාගය යි.

"උන් වහන්සේ එළුවන්ගේත් වස්සන්ගේත් ලෙයින් නොව, තමන්ගේ ම ලෙයින් අප උදෙසා සදතන විමුක්තිය ලබා සඳහට ම එක වරක් ශුද්ධස්ථානයට ඇතුළු වූ සේක. ........... දෙවියන් වහන්සේට පූජා වූ ක්‍රිස්තුන් වහන්සේගේ ලේ කරණකොටගෙන, ඊටත් ඉතා වැඩියෙන් පිරිසිදු නොවන්නේ ද?" (හෙබ්‍රෙව් 9:12-14)



14.2 රූපය - පූප හා මිදියුස දිවරහස් කිරීම

ජුදෙ යාග පිළිවෙත් සම්පූර්ණත්වයට පත් කරමින් ක්‍රිස්තුන් වහන්සේ කල්වාරි කඳු මුදුනේ දී කුරුසිය මත යාග වූ සේක. එය සර්ව සම්පූර්ණ යාගයකි. එබැවින් සත්ත්ව යාග හෝ වෙනයම් යාග හෝ නැවත නැවත කළ යුතු නැත. තව ද ඔවුන් වහන්සේ නව ගිවිසුමෙහි පාස්කු බැටළු පෝතකයාණන් වෙමින්, මිනිසා හා දෙවියන් වහන්සේ අතර සබැඳියාව ඇති කරන උත්තම පූජකයාණන් වූ සේක. ඔවුන් වහන්සේ දිව්‍ය ශ්‍රී පූජා යාගය තුළින් කල්වාරි යාගය ඉදිරියට ගෙන යන සේක. ලේ වැගිරීමකින් තොර ව අල්තාරය මත සක්‍රමේන්තු ආකාරයට එය සිදු කරන සේක.

දෙවියන් වහන්සේ සමග සබැඳියාව ගොඩ නැගෙන පූජාවක් ලෙස අපගේ ජීවිතය ද දෙවියන් වහන්සේට පිදෙන යාගයක් බවට පත් කර ගත යුතු ය. එදිනෙදා වැඩ කටයුතු, දුක්වේදනා, සතුටු සිනා, දෙවියන් වහන්සේට පිදෙන පඬුරක් බවට පත්කර ගත යුතු වේ. එසේ නම් ජීවිත අභියෝග වලට මුහුණ දෙමින් දුක් වේදනා දරා ගෙන දේව ප්‍රශංසාව සඳහා ඔප්පු විය යුතු වේ. අපට පැවරෙන යුතුකම්, වගකීම් නිසිලෙස ඉටුකරලීමට වගබලා ගැනීම තුළින් කිතුනු ශ්‍රාවකත්වයට සාක්ෂි දරීමක් වන අතර ම සමාජයට වැඩදයි පුද්ගලයන් වේ. මෙසේ අපගේ ජීවිත දෙවියන් වහන්සේට එදිනෙදා පිදෙන පූජාවක් වේ.

ජීවිතයේ විවිධ අවස්ථාවල දී පාපයන්ට යොමුවීමෙන් දේව සබඳතාව අහිමි හෝ පළුදු විය හැකි ය. එවැනි අවස්ථාවල තම වැරදි (පාපයන්) පිළිගෙන සැබෑ මනස්තාපයක් හා සිත් හැරීමක් තුළ යහපත් පාපෝච්චාරණයක් වෙත යොමුවීමට පුරුදු පුහුණු විය යුතු ය. මෙලෙස අපි ක්‍රිස්තුන් වහන්සේ තුළ පාපයට මැරී නව ජීවිතයකට උත්ථාන වෙමින් කල්වාරි යාගයට සම්බන්ධ වෙමු.



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

අප ජීවත් වන සමාජය තුළ අන් අයගේ දුක් වේදනා, අසරණකම්, දුබලතා හමුවේ ඒ අයට පිහිටවීම කිතුනුවාගේ යුතුකමක් බව අපි වටහා ගෙන සංවේදී වෙමු. ක්‍රිස්තු ආදර්ශය අනුව සමාජයේ අසරණයන්, අනාථයන්, රෝගීන් හා පව්කරුවන් වෙත දයා කරුණාවෙන් පිහිට වෙමු. එමෙන් ම පරාර්ථකාමී වීම, වැය වීම අවශ්‍ය වේ. මේ සඳහා අපගේ කාලය, ශ්‍රමය, ධනය, හැකියා වැය කළ යුතු වේ. එලෙස එදිනෙද ජීවිතය තුළ දෙවියන්ට පිදෙන යාගයක් විය හැකි ය. ජාතීන්ගේ විනිශ්චය දිනයේ ක්‍රිස්තුන් වහන්සේ යොද ගන්නා මිනුම් දණ්ඩ ද එය වේ (මතෙව් 25:41-46 ශාරීරික පුණ්‍ය ක්‍රියා).

එහෙයින් අපගේ ජීවිතය තුළ එදිනෙද වැයවෙමින්, යහපත් ජීවිතයක් ගත කරමින් ක්‍රිස්තුන් වහන්සේ හා සබැඳියාව වැඩි වර්ධනය කර ගනිමින් දෙවියන් වහන්සේට පිදෙන යාගයක් වීමට උත්සාහ දරමු.

## ක්‍රියාකාරකම

1. පුරාණ ගිවිසුමේ යාග පැවැත්වීමේ පරමාර්ථ **දෙකක්** ලියන්න.
2. ඉශ්‍රායෙලයේ පූජා වර්ග බෙදිය හැකි ප්‍රධාන කොටස් **දෙක** දක්වන්න.
3. නොදවන පූජාවන් සඳහා භාවිත කළ ද්‍රව්‍ය **හතරක්** ලියන්න.
4. නව ගිවිසුමේ කල්වාරි යාගය උතුම් වීමට හේතු **දෙකක්** ලියන්න.
5. ඔබට අන් අය වෙනුවෙන් යාග (පරිත්‍යාගි) විය හැකි අවස්ථා **දෙකක්** දක්වන්න.



***ජීවිතය සඳහා***

***කල්වේලා ඇති ව දේවස්ථානයට ගොස් දිව්‍ය පූජාවට පෙර හා පසු විනාඩි කිහිපයක් යාච්ඤා කරමු.***